## මගෙන් වචනයක්..

උසස් පෙලට ඔයා මිඩීයා තෝරගන්න හේතු සැහෙන්න ඇති.ආසම සබ්ජෙක්ට් එක නිසා,ඉසෙඩ් එක වැඩි,ලේසි නිසා,යාලුවා කරන නිසා,එයා කරන නිසා,ගෙදරින් කිව්ව නිසා ඔය වගෙ හේතු ඇති.

ඒ මොන හේතුව තිබුනත් පොඩ්ඩො ඔයා විභාගෙට හොද ලකුණක් දාන්නම ඔනි.ඔයාට මොන හේතුවක් තිබ්බත් ඔයාගෙ දෙමව්පිය-න්ට තියෙන්නෙ එක හේතුවයි.ඒ මගෙ දුව මගෙ පුතා හොද තැනකට එවි කියන බලා-පොරොත්තුව විතරයි.ඒ බලාපොරොත්තුවත් හේතුවත් ඉශ්ඨ කරගෙන ඔයාගෙ හීනත් ඉශ්ඨ කරගෙන ඔයා විභාගේ ඉහලින්ම සමත් වෙන්න ඔනි.

ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙපා.සහභාගි වෙලා ෆෙල් ලකුනක් අරන් වැඩක් නැ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!

Lorem Ipsum

Design by - Creativepixel.lk - Search us on fb/insta

Advanced level 2023

මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම තිතටම මීඩියා

විස්තරාත්මක කෙටිසටහන් පොත

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

COMMUNICATION & MEDIA STUDIES

Advanced level 2023

# මීඩියා

මොළේටම තිතටම මීඩියා

විස්තරාත්මක කෙටිසටහන් පොත



පළමු වැනි පාඩම

The Origins and Evolution of Communication Studies

# සන්නිවේදන අධ්‍යනයෙහි ආරම්භය හා විකාශය

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ලහිරු කේ. මදුශාන්
HNDIT , mass communication (UG)
076 3950730
071 0538308

## අමතර කරුණු



## 1.1 සන්නිවේදන අධ්‍යනයෙහි ආරම්භය හා විකාශය

මිනිසා මිහි මත ජීවත්වීම ආරම්භ කළ මොහොතේ සිට මානව සන්නිවේදනය බිහි විය.

**සන්නිවේදනය යන්නෙහි සරළ අර්ථය වන්නේ හැගීම් දැනීම් අදහස් සහ දැනුම ආදිය හුවමාරු කර ගැනිමයි.**

**ප්‍රාථමික සමාජ වල මිනිසුන් විවිධ ශබ්ද සංඥා සංකේත භාවිතයෙන්** අදහස් හුවමාරු කර ගනු ලැබීය.

**වර්තමානයේ මිනිසුන් ජනමාධ්‍ය හා අංකිත සන්නිවේදන මෙවලම් භාවිතයෙන් සන්නිවේදනයේ යෙදෙයි.**

සන්නිවේදන අධ්‍යනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ **මානව අත්දැකීම් වල කේන්ද්‍රීය සාධකය ලෙස සන්නි-වේදනය ක්‍රියාත්මක වන ආකාරය** පිළිබඳව හැදෑරීමයි.

ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් **ලෙස සන්නිවේදන අධ්‍යයනය කිරීම කෙරෙහි ලෝකයේ අවධානය** යොමු වන්නේ 20 සියවසේ මුල් භාගයේදී ය.

ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස **සන්නිවේදනය අධ්‍යයනය කිරීමට ඉවහල් වූ හේතු,**

1. **කාර්මික විප්ලවය**

2. **පළමුවන හා දෙවන ලෝක යුද්ධ හේතුවෙන් තාක්ෂණයේ සිදුවූ සීඝ්‍ර දියුණුව.**

3. යුද්ධයෙන් පීඩාවට පත්ව සිටි ජනතාව ඉලක්ක කරගෙන සරල **විනෝදය ත්‍රාසය භීතිය විරත්වය ලිංගිකත්වය මතු කරන සන්දේශ බහුලව ඉදිරිපත් කිරීම හා එහි බලපෑම.**

4. **වාණිජ පරමාර්ථ හා බලය** ලබා ගැනීමේ අපේක්ෂා-වෙන් **මාධ්‍ය හිමිකරුවන් සහ දේශපාලන නායකයන් විසින් අත්තනෝමතිකව ජනමාධ්‍ය භාවිතයට ගැනීම.**

5. **එක්දහස් නව සිය විසි ගණන් වලදී විවිධ විෂය ක්ෂේත්‍ර වල විද්වතුන් සිදු කළ පර්යේෂණ මගින් ජනමාධ්‍ය පුද්ගලයා සහ සමාජ සම්බන්ධතා කෙරෙහි බලපෑමක් අති කරන බව තහවුරු කිරීම.**

මෙම විෂය ස්වාධීන විෂයක් බවට පත්වීමට පෙර **මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව** මගින් පෝෂණය විය

සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් බවට පත්කිරීමට මූලික වූ විද්‍යාඥයින් තිදෙනා ඔවුන් අයත් වූ විෂය ක්ෂේත්‍ර හා රචනා කරන ලද කෘතීන්,

**චාල්ස් හෝර්ටන් කූලි ( 1864 1929)**
*** සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය**
**( සමාජ සංවිධානය කෘතිය * 1909)**

**වෝල්ටර් ලිප්මාන් ( 1889 *1974 )**
*** දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය**
**(ජනමතය * 1922)**

**ජෝන් ඩුවි ( 1859 * 1952)**
*** අධ්‍යාපන විද්‍යා විෂය ක්ෂේත්‍රය**
**( ජනතාව හා ඔවුන්ගේ ගැටලු * 1927)**

චාල්ස් හෝර්ටන් කූලි සන්නිවේදනය විග්‍රහ කරන ලද්දේ මානව සම්බන්ධතා පවත්වා ගැනීමේ හා වර්ධනය කිරීමේ යාන්ත්‍රණය වශයෙනි.

යුරෝපීය සහ ඇමෙරිකානු විද්වතුන් රාශියකගේ මූලිකත්වයෙන් සිදු කරන ලද අධ්‍යයනය තුළින් මෙය ස්වාධීන විෂයක් බවට පත්විය.

1933 * 1945 ජර්මනියේ ක්‍රියාත්මක වූ ඇඩොල්ෆ් හිට්ලර්ගේ ඒකාධිපති පාලනය යටතේ එරටින් පිටමං කරන ලද විද්වතුන් ඇමෙරිකාවේ විශ්වවිද්‍යාල වලට පැමිණ සිදු කරන ලද අධ්‍යයන වලින් මෙම විෂය වර්ධනය විය.එම විද්‍යාඥයින්,

**හැරල්ඩ් ඩී ලැස්වේල් ( 1902 1978)**
**කර්ට් ලෙවින් ( 1890 * 1947 )**
**පොල් එෆ් ලැසඩ්ෆෙල්ඩ් ( 1901 * 1976)**
**කාර්ල් අයිවර් හව්ලන්ඩ් ( 1912 * 1961)**
**විල්බර් ශ්‍රාම් ( 1907 * 1987)**
**ජෝර්ජ් ගබ්නර් ( 1919 * 2005)**
**වොරන් විවර් ( 1894 * 1978)**
**ක්ලෝඩ් ශැනන් ( 1916 * 2001)**

1940 දශකයේ දී **විල්බර්ශ්‍රාම් සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ආයතන ගත කිරීමට** පියවර ගන්නා ලදී ඒ සදහා ජනමාධ්‍ය පාසල් සන්නිවේදන පර්යේෂණ ආයතන විශ්වවිද්‍යාල සඳහා නව අධ-්‍යයන අංශ ආරම්භ කළේය.

සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වූ පළමු විශ්වවිද්‍යාලය **ඉලිනොයිස් විශ්වවිද්‍යාලයයි.**



# අමතර කරුණු

# 1.2 ශ්‍රී ලංකාවට සන්නිවේදන විෂය හදුන්වා දීම

**දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය** මගින් සන්නිවේදන විෂය ශ්‍රී ලංකාවට ප්‍රථම වරට හඳුන්වා දුන්නේය **1968 * 1969 කාලයේදී පුවත්පත් කලාවේදය යනුවෙන් පාඨමාලාවක්** හදුන්වා දුන්නේය.

ඉහත පාඨමාලාවේ විෂය නිර්දේශය සකස් කරන ලද්දේ **ආචාර්ය එඩ්වින් ආරියදාස මහතා විසිනි එවකට සිටි අධ්‍යාපන ඇමති අයි.එම්.ආර්.ඒ.ඊරියගොල්ල මහතා මූලිකත්වය** ගන්නා ලදී වසර දෙකකින් එම පාඨමාලාව අවලංගු විය.

**1971 කැරැල්ලෙන් පසුව විශ්වවිද්‍යාල වලට වෘත්තීය අභිමුඛ පාඨමාලාවක් වශයෙන් සන්නිවේදන විෂය හදුන්වා දුන්නේය.**

**1973 දී කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය** බිහිවිය. ඒ සදහා පත්කළ විද්වත් කමිටුවට අයත් වු විද්වතුන්,

මහාචාර්ය විමල් දිසානායක
මහාචාර්ය සුනන්ද මහේන්ද
මහාචාර්ය එම් ආරියපාල
මහාචාර්ය එදිරිවීර සරත්චන්ද
ආචාර්ය එඩ්වින් ආරියදාස
ඩී සී රණතුංග

**කැළණිය විශ්වවිද්‍යාලයේ මෙම විෂය මුලින්ම ඉගැන්වූ කථිකාචාර්යවරු**

මහාචාර්ය විමල් දිසානායක
මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

**කැළණිය විශ්වවිද්‍යාලයේ මෙම විෂය මුලින්ම ඉගැන්වූ බාහිර කථිකාචාර්යවරු**

ආචාර්ය එඩවින් ආරියදාස
ආචාර්ය පියසෝම මේදිස්
ඩී බී නිහාල්සිංහ
කේ ජයතිලක
මහගම සේකර
ඩබ්ලිව් ඩී අමරදේව
ඩී සී රණතුංග
පියසිරි ගුණරත්න

**1972 වසරේ දී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුවත්පත් කලාව යනුවෙන් ඩිප්ලෝමා පාඨමාලාවක්** ආරම්භ කරන ලදී මෙය වසරකින් නැවැතිනි.

**1960 දශකයේ දී ලංකා ගුවන්විදුලි සේවය හා ලේඛ්හවුස් ආයතනය මගින් වෘත්තීය මාධ්‍යවේදීන් සදහා පුහුණු පාඨමාලා** ආරම්භ කළේය.



**විල්බර්ශ්‍රාම්** ළමයින්ගේ සමාජ සම්බන්ධතා දුරස්වීම හා රූපවාහිනිය භාවිතය අතර සම්බන්ධයක් ඇති බව පර්යේෂණයක් මගින් පෙන්වා දුන්නේය. **දෙමව්පියන් සමග අඬදබර කර ගන්නා ළමුන් තම නොරිස්සුම් සහගත හැගීම් වලින් පලා යාමටත්,සිත්වේදනාවන් අමතක කර ගැනීමට රූපවාහිනිය නැරඹීමට යොමු වන බව පෙන්වා දුන්නේය.**

**පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාලය** පර්යේෂණ කණ්ඩායම සිදු කළ පර්යේෂණය.

■ ප්‍රචන්ඩ ක්‍රියා සහිත හා රහිත රූපවාහිනී කාටූන් වැඩසටහන් ළමයින් කණ්ඩායම් දෙකකට නැරඹීමට අවස්ථාව ලබා දෙන ලදී.

■ ප්‍රචන්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නැරඹූ ළමයින් තුළ ප්‍රධාන වෙනස්කම් තුනක් සිදු විය.

■ වේදනාත්මක දේ පිළිබඳව සංවේදීතාව අඩුවීම.

■ තමන් ජීවත්වන පරිසරය හා අවට ලෝකය පිළිබඳ බියක් ඇති කර ගැනීම.

■ අන්අය සමග කටයුතු කිරීමේ දී ආක්‍රමණශීලි සහ ආරවුල් ඇති කර ගන්නා ස්වභාවයක් පෙන්වීම.

**සන්නිවේදන අධ්‍යනය ක්ෂේත්‍රය පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ**

■ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය.

■ විචාරශීලී මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය.

■ අවශ්‍ය අදාළ තොරතුරු තෝරා ගැනීමේ හැකියාව.

■ ගවේෂණශීලී භාවය විචාරාත්මක චින්තනය දියුණු වීම.

■ මාධ්‍ය සාක්ෂරතාව.

■ යහපත් ආචාරශීලි හා ඵලදායී මානව අන්තර් සම්බන්ධතා වර්ධනය.

■ සමාජ ප්‍රගමණය සඳහා සක්‍රිය දායකත්වය.

■ නිර්මාණාත්මක චින්තනය හා මාධ්‍ය සන්දේශ නිර්මාණය.

■ සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් පෝෂණය පුරවැසියෙකු වීමට අවශ්‍ය දැනුම ආකල්ප කුසලතා හා පුරුදු වර්ධනය.

■ ජනමාධ්‍ය ආයතනයන් ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය.

## 1.2 ශ්‍රී ලංකාවට සන්නිවේදන විෂය හදුන්වා දීම

**දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය** මගින් සන්නිවේදන විෂය ශ්‍රී ලංකාවට ප්‍රථම වරට හදුන්වා දුන්නේය **1968 * 1969 කාලයේදී පුවත්පත් කලාවේදය යනුවෙන් පාඨමාලාවක්** හදුන්වා දුන්නේය.

ඉහත පාඨමාලාවේ විෂය නිර්දේශය සකස් කරන ලද්දේ **ආචාර්ය එඩ්වින් ආරියදාස මහතා විසිනි එවකට සිටි අධ්‍යාපන ඇමති අයි.එම්.ආර්.ඒ.ඊරියගොල්ල මහතා මූලිකත්වය** ගන්නා ලදී වසර දෙකකින් එම පාඨමාලාව අවලංගු විය.

**1971 කැරැල්ලෙන් පසුව විශ්වවිද්‍යාල වලට වෘත්තීය අභිමුඛ පාඨමාලාවක් වශයෙන් සන්නිවේදන විෂය හදුන්වා දුන්නේය.**

**1973 දී කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය** බිහිවිය. ඒ සදහා පත්කළ විද්වත් කමිටුවට අයත් වූ විද්වතුන්,

මහාචාර්ය විමල් දිසානායක
මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර
මහාචාර්ය එම් ආරියපාල
මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර
ආචාර්ය එඩ්වින් ආරියදාස
ඩී සී රණතුංග

**කැළණිය විශ්වවිද්‍යාලයේ මෙම විෂය මුලින්ම ඉගැන්වූ කථිකාචාර්යවරු**

මහාචාර්ය විමල් දිසානායක
මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

**කැළණිය විශ්වවිද්‍යාලයේ මෙම විෂය මුලින්ම ඉගැන්වූ බාහිර කථිකාචාර්යවරු**

ආචාර්ය එඩ්වින් ආරියදාස
ආචාර්ය පියසෝම මෙදිස්
ඩී බී නිහාල්සිංහ
කේ ජයතිලක
මහගම සේකර
ඩබ්ලිව් ඩී අමරදේව
ඩී සී රණතුංග
පියසිරි ගුණරත්න

**1972 වසරේ දී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුවත්පත් කලාව යනුවෙන් ඩිප්ලෝමා පාඨමාලාවක්** ආරම්භ කරන ලදී මෙය වසරකින් නැවැතිනි.

**1960 දශකයේ දී ලංකා ගුවන්විදුලි සේවය හා ලේක්හවුස් ආයතනය මගින් වෘත්තීය මාධ්‍යවේදීන් සදහා පුහුණු පාඨමාලා** ආරම්භ කළේය.



**වර්තමානයේ සන්නිවේදන විෂය පිළිබඳ පාඨමාලා පවත්වන ආයතන**

කැලණිය විශ්ව විද්‍යාලය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
කොළඹ විශ්ව විද්‍යාලය
කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය
රජරට විශ්ව විද්‍යාලය
විවෘත විශ්ව විද්‍යාලය
නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය
යාපනය විශ්ව විද්‍යාලය

**උගන්වනු ලබන සන්නිවේදන පාඨමාලා වර්ග**

සහතික පත්‍ර පාඨමාලා
ඩිප්ලෝමා පාඨමාලා
සාමාන්‍ය උපාධි
විශේෂ උපාධි
පශ්චාත් උපාධි
ආචාර්ය උපාධි

ජාතික අධ්‍යාපන ආයතනය විසින්
**2006 වසරේ දී 10 ශ්‍රේණියටත්,**
**2007 වසරේදී 11 වන ශ්‍රේණියටත්,**
**අතිරේක විෂයක් ලෙස සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හදුන්වා දුන්නේය.**
**2008 වසරේ සිට උසස් පෙළ කලා විෂයට** ද මෙය ඇතුලත් කර ඇත

## 1.3 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය විෂය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගෙනීමෙහි අවශ්‍යතාවය

**1982 වසරේ දී යුනෙස්කෝ සංවිධානය ගෲන්වල්ට් ප්‍රකාශනයේ නිර්දේශ වලට අනුව**

2006 වසරේ සිට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය 10 සහ 11 ශ්‍රේණි සදහා අතිරේක විෂයක් ලෙස හඳුන්වා දුන්නේය. 2008 වසරේ සිට උසස් පෙළ කලා විෂයට ඇතුලත් කළේය.

**මාධ්‍ය අධ්‍යාපනය යනු පුද්ගලයා මාධ්‍ය සාක්ෂරතාවයෙන් යුක්ත අයෙකු බවට පත්කිරීමේ ක්‍රියාවලියයි.**

මාධ්‍ය අධ්‍යාපනය මගින් සියලු මාධ්‍ය කෙරෙහි අවධානය යොමු කරවයි.